**මූතූර් ප්‍රාදේශීය සභාව - 2021**
**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මූතූර් ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මූතූර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා  දැක්වීම  හේතුවෙන්  සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන්  සිදුවන  බලපෑමට  වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීම , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා  වන  බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක්  ලබාගන්නා  ලදී.

- භාවිතා  කරන  ලද  ගිණුම්කරණ  ප්‍රතිපත්තිවල  උචිතභාවය,  ගිණුම්කරන  ඇස්තමේන්තුවල සාධාරණත්වය  සහ  කළමනාකරණය  විසින්  කරන ලද  සම්බන්ධිත  හෙළිදරව්  කිරීම්  අගයන  ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම  අගයන  ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ  ප්‍රාදේශීය සභාවේ  කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කලාකරුවන්ට උපහාර දැක්වීම සඳහා රු. 150,000 ක් වැය වූ බව දක්වා තිබුණත් මෙම මුදලින් රු.109,500ක් වියදම් නොකර තැන්පත් ගිණුමක රඳවා තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් රු.109,500කින් වැඩියෙන් දක්වා තිබුණි. | රටෙහි පැවැති අයහපත් වාතාවරණය හේතුවෙන් එම වර්ෂයේ පැවැත්වීමට නොහැකි විය. 2022.03.31 දින වැඩසටහන පවත්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයේ සිදුකළ වියදම් පමණක් ගිණුම්වල ඇතුළත් කළ යුතුය. |
| (ආ) | පළාත්පාලන සහකාර කොමසාරිස්වරයා විසින් සභාවට භාරදී තිබූ යන්ත්‍ර උපකරණවලින් 2017 සිට 2020 දක්වා කාලපරිච්ඡේදයේ ලැබූ ආදායම්, කසල මළු සහ වීථි රේඛා ගාස්තු ආදායම් එකතුව රු.3,291,700ක් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. එසේම, සමාලෝචිත වර්ෂයේ ලැබූ රු.1,401,750ක්, ආදායමක්, තැන්පත් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ප්‍රාදේශීය පළාත්පාලන සහකාර කොමසාරිස්වරයා විසින් සභාවට භාරදී තිබූ JCB, Motor Grader වාහනවල කුලී ආදායම් ලෙස තැන්පත් ගිණුමේ ඇති වටිනාකම් නිවැරදි කරනු ලැබේ. | සභාවේ ආදායම් නියමිත මුදල් වර්ෂයට ඇතුළත් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | වටිනාකකම<br>රු. | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|---|
| (අ) | **1987** අංක **15** දරන ප්‍රාදේශීය සභා පනතේ **1**82 වගන්තිය | **2,324,357** | ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු රු.50ක් ඉක්මවූ මුදල් ප්‍රමාණයක් කපාහැරීම සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ හිඟහිටි | ඉදිරි කාලයේදි මෙවැනි කපාහැරීම් සිදුකිරීමේදි අමාත්‍යාවරයාගේ අනුමැතිය ලබා කටයුතු සිදුකරනු | ප්‍රාදේශීය සභා පනතට අනුකූලව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ආදායම්, ආරම්භක හිඟහිටි ශේෂවලින් කපාහැර තිබුණි. | ලැබේ. | |
| (ආ) | මු.රෙ. 371 | **11,129,351** | ගෙවනු ලැබූ සියළුම අත්තිකාරම් කාර්යය නිමකළ විගස නිරවුල් කළයුතු වුවත්, වර්ෂ 15කට අධික කාලයක සිට නිරවුල් කර නොතිබුණි. | අදාල හිඟහිටි ශේෂ 2006 වර්ෂයට පෙර කාලපරිච්ඡේදයට අදාල වේ. එම නිසා, ඒවාට අදාල ලිපි ලේඛන අප සතුව නොපවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. |
| **(ඇ)** | **අනෙකුත් චක්‍රලේඛ** | | | | |
| | මු.රෙ. 880 සහ 2021 අගෝස්තු 16 දිනැති අංක PT/03/2021 දරන පළාත් මූල්‍ය චක්‍රලේඛය | **97,500** | ප්‍රාදේශීය සභාවේ රාජකාරි ඉටුකරනු ලබන, ආරක්ෂිත ඇපමුදල් අයකළ යුතු නිලධාරීන් 16කගෙන් ඇප තැන්පතු මුදල් අයකර නොතිබුණි. | අයකිරීමට කටයුතු කරමින් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 24,690,240ක් වූ අතර ඊට ,අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු17,810,238 .ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වරිපනම් හා බදු | | |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව හිඟ වරිපනම් අය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට වර්ෂ 13ක කාලයක සිට හිඟහිටිව පැවැති ගාස්තු එකතුව රු. 6,488,977ක් අයකර ගතයුතුව පැවතුණි. | වර්තමානයේ අයකිරීමට ඉදිරි පියවර ගෙන ඇත. | හිඟහිටි වරිපනම් බදු අයකිරීමට පියවර ගත යුතුය. |

(ආ) කුලී

-----

(i) බස් නැවැතුම්පළ කඩකාමර කුලී

-----------------------------------

| | | | |
|---|---|---|---|
| 1) | 2021 දෙසැම්බර් 31 දින හිඟහිටි ලෙස රු.1,062,101ක් වර්ෂ 07ක කාලයක සිට පැවැතියද ඒවා අයකිරිමට සභාව විසින් පියවර ගෙන නොතිබුණි. | හිඟහිටි කුලී පියවරෙන් පියවර අයකරමින් පවතින අතර ගෙවීම් පැහැර හැරි අයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. | හිඟහිටි මුදල් අයකර ගැනීමට පියවර ගතයුතුය. |
| 2) | 2016 වර්ෂයේ කුලී ගිවිසුමේ 2 වගන්තිය ප්‍රකාරව වාර්ෂිකව කුලී වටිනාකමින් සියයට 10ක වැඩිවීමක් සහිතව කුලී ගෙවීමට එකඟ වී තිබුණත්, වැඩි කළ වටිනාකමින් කුලී අයකර නොමැති හෙයින් සභාවට රු.370,348ක ආදායම් අහිමි වී තිබුණි. | සියයට 10ක වටිනාකම වැඩිකිරීමට කටයුතු කරනු ලැබේ. | ගිවිසුම් ප්‍රකාරව කුලී අයකිරිමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

(ii) වෙළෙඳපොල කඩකුලී

------------------------------

| | | |
|---|---|---|
| වෙළෙඳපොල කඩකුලීවලින් වර්ෂ 1 සිට 13ක් දක්වා හිඟහිටිව පැවැති රු.529,670ක් අයකිරිමට පියවර ගෙන නොතිබුණි. | දත්ත පවතින කාලය පදනම් කරමින් ඉදිරියේදි අයකිරිමට පියවර ගනු ලැබේ. | හිඟහිටි අයකර ගැනීමට උචිත පියවර ගතයුතුය. |

(iii) මස්කඩ කුලී

-----------------

| | | | |
|---|---|---|---|
| 1) | 2020 සහ 2021 මූල්‍ය වර්ෂවල කුකුළු මස්කඩවලින් ලැබිය යුතු හිඟහිටි කුලී ආදායම් එකතුව රු.3,407,886ක් අයකිරීමට පියවර ගෙන නොතිබුණි. | වර්තමානයේ කුකුළු මස්කඩ සඳහා බදුකුලි දීම සඳහා ලංසු කැඳවා නොමැත. එසේම, හිඟහිටිව පවතින රු.3,407,886ක් කපාහැරිමට පියවර ගනු ලැබේ. | හිඟහිටි මුදල් නිරවුල් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| 2) | 2009 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා හිඟහිටි බදුකුලී රු.7,279,598ක් වුවත්, අයකිරිමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2021 වර්ෂය සඳහා බදුකුලි සම්පූර්ණ යෙන් අයකර ඇත.දීර්ඝ කාලයක සිට පවතින රු.7,279,598ක් නිරවුල් කිරිමට පියවර ගනු ලැබේ. | හිඟහිටි මුදල් අයකිරිමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම හා ජනතාවගේ සුබ විහරණය පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඩෙංගු මර්දන වැඩසටහන සඳහා වෙන්කළ රු. 516,854ක ප්‍රතිපාදන අදාල ව්‍යාපෘතිය සඳහා උපයෝජනය නොකර අනෙකුත් තැන්පතු ගිණුමේ තැන්පත් කර තිබුණි. | සභාවේ ආදායමට මාරුකිරීමට විධිවිධාන යොදනු ලැබේ. | ප්‍රතිපාදන අදාළ ව්‍යාපෘතිය සඳහා උපයෝගි කරගත යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.54,722,750 ක් වටිනා ඉඩම් සඳහා හිමිකම් ඔප්පු ලබාගැනීම හෝ ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කිරීම සිදුකර නොතිබුණි. | ඉඩම් හිමිකම් ඔප්පු ලබාගැනීම සහ ලේඛනවල ලේඛනගත කිරිම වැනි කාර්යයන් සිදුකරමින් පවතී. | සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඇ) | පළාත් පාලන සහභාගීත්ව පදනමින් වූ සංවර්ධන සැලැස්ම (LAPDP 2019) අනුව වර්ෂ 04ක සංයුක්ත සැලැස්මෙන් ව්‍යාපෘති 130ක් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණි. නමුත්, වර්ෂ 03ක් ඉකුත්වී තිබූ නමුත් ව්‍යාපෘති 4ක් පමණක් ඉටුකර තිබූ අතර රු. මිලියන 3,333ක් වූ ව්‍යාපෘති 126ක් ක්‍රියාත්මක නොකර වෙනත් නව ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව පළාත්පාලන සහභාගීත්ව සංවර්ධන සැලැස්ම කාර්යක්ෂම අන්දමින් සකස් කර නොතිබූ බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘති සඳහා අරමුදල් ලැබෙන පදනම මත මෙම සැලැසුම් ක්‍රියාත්මක කෙරෙන බැවිනුත් සභාවේ අරමුදල් සීමිතව පවතින බැවිනුත් සීමිත ව්‍යාපෘති සංඛ්‍යාවක් පමණක් ක්‍රියාත්මක කළ හැකිව තිබුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඈ) | වර්ෂ 12කට අධික කාලයක් ලංකා බැංකුව සහ මහජන බැංකුවේ ඉතිරි කිරීම් ගිණුම්වල අක්‍රියව පැවැති රු.555,998ක ශේෂ තිරසාර සංවර්ධන අරමුණු සඳහා ආයෝජනය නොකර නිෂ්කාර්යව පැවැතුණි. | ගිණුම්වලින් ලැබෙන පොලීය සෑම වර්ෂයකම අවසන් ගිණුම් වාර්තාවල පොලී ආදායම් ලෙස ඇතුළත් කර ගිණුම් සකසනු ලැබේ. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ කොවිඩ් - 19 වසංගතය පැතිරී අයහපත් වාතාවරණය නිසා කඩකාමර වසා දැමීම සහ නැවත කඩකාමර විවෘත කිරීමෙන් පසුවත් ජනතාව සංසරණය අවම වීම හේතුවෙන් ගිවිසුම්කරුවන්ට ලබාදුන් එකතුව රු.5,770,983ක් වූ වට්ටම් නියමිත බලධාරීන්ගෙන් පූර්ව අනුමැතියකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල අඩුකර දක්වා තිබුණි. | ලියකියවිලි අදාල බලධාරීන්ට යවා ඇත. අනුමැතිය ලැබීමෙන් පසුව එහි පිටපතක් ඔබට යවනු ලැබේ. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක්ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනැවිය යුතු වුවත්, 2021 දෙසැම්බර් 31 දින දක්වා කාරණා 05ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. මේ හේතුවෙන් ඉතිරි අතුරු ව්‍යවස්ථා 25ම අනුමත කර නොතිබූ හෙයින් එමගින් ලැබෙන ආදායම් අයකළ නොහැකිව පැවැතුණි. | ප්‍රසිද්ධ කිරීමේ (Publish) කටයුතු සිදුකිරිමට අනුමැතිය ලබාගැනීමට යවා ඇත. | ප්‍රදේශයේ කටයුතු නියාමනය කිරීමට අවශ්‍ය අතුරු ව්‍යවස්ථාවක් පනවා ගතයුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | නිෂ්කාර්ය වත්කම් | | |
| (අ) | තෝප්පූර්හි 2014 වර්ෂයේදී රු. 4,967,426ක පිරිවැයකින් ඉදිකළ කඩකාමර 12කින් යුත් කඩකාමර සංකීර්ණය වර්ෂ 07ක සිට කුලියට දීමට පියවර ගෙන නොතිබුණි. | තෝප්පූර්හි ඉදිකළ කඩකාමර ඉදිරියේදි අළුත්වැඩියා කර කුලියට දීමට කටයුතු කරනු ලැබේ. | කුලියට දීමට පියවර ගතයුතුය. |
| (ආ) | සාම්පූර්හි රු.3,669,340ක පිරිවැයකින් 2017 වර්ෂයේ ඉදිකළ වෙළෙඳපොල ගොඩනැගිල්ල වර්ෂ 04ක සිට භාවිතා කර නොතිබුණි. | සාම්පූර්හි පැවැති වෙළෙඳපොල ගොඩනැගිල්ල ව්‍යාපාරිකයන් විසින් භාවිතා නොකිරිම නිසා වෙළෙඳාම අඩුවී තිබීම හේතුවෙන් කුලියට ලබාගැනීමට ව්‍යාපාරිකයින් ඉදිරිපත් නොවීම හෙතුවෙනුත් භාවිතා කර නොතිබුණි. ඒ සඳහා වෙනත් විධිවිධාන යොදනු ලැබේ. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 2.1 ට අනුව ප්‍රාදේශීය සභා සභාපති වරයා සහ ප්‍රාදේශීය ලේකම් වරයා විසින් නම් කරන තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක නිර්දේශ නොගෙන ප්‍රජා සංවර්ධන නිලධාරිගේ නිර්දේශ මත අනුමත සමිති වෙත එකතුව රු.19,464,854ක කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. | ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථානවලට ලබාදීම, ප්‍රජා සංවර්ධන නිලධාරීගේ නිර්දේශ නොමැතිව සිදුකළ නොහැක. ඔහුගේ නිර්දේශ සහ සෑහීමට පත්වීම ආදිය ලැබීමෙන් පසුව පමණක් ප්‍රජා මූල මධ්‍යස්ථානවලට ලබාදීමට හැකිවේ. | චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු කළයුතුය. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තෝප්පූර් ළමා උද්‍යාන ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය රු.3,000,000 | | |
| | තෝප්පූර් ළමා උද්‍යාන ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය රු.2,718,202ක වියදමක් දරා ඉදිකර ක්‍රීඩා උපකරණ සවිකර තිබුණද, නඩත්තු කිරීමේ කම්කරුවන් අනුයුක්ත කර නොතිබුණි. එසේම ළමා උද්‍යානය පිටුපස කොටස භයානක ජලාශ්‍රිත ස්ථානයක පැවැති අතර ළමුන්ට ක්‍රීඩාකිරිමට සුදුසු ආකාරයේ වාතාවරණයක්ද නොපැවැතුණි. | සඳහන් කළ BOQ No:39 සහ කාර්යයන් 03ක රටෙහි පැවැති අයහපත් වාතාවරණය හේතුවෙනුත භාණ්ඩවල හිඟය හේතුවෙනුත් සම්පූර්ණ කළ නොහැකිව තිබුණි. නමුත් මේ වන විට අදාල කාර්යයන් සම්පූර්ණ කර ඇත. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ආ) | මූතූර් විනෝදාශ්වාද උද්‍යානය ඉදිකිරීම | | |
| (i) | රු.81,000ක් වූ ක්‍රීඩා උපකරණ සවිකිරීමේ කාර්යය, කාර්යය අවසන් කිරීමේ වාර්තාවේ විස්තරයට අනුකූලව නොපැවැතුණි. | ඉදිරි කාලයේදි මෙවැනි අඩුපාඩු සිදුනොවී පැවැතීමට පියවර ගනු ලැබේ. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ii) | ඉහත ඉදිකිරීමේ කාර්යයේ එකතුව රු.180,000ක් වූ ක්‍රීඩා උපකරණ දීර්ඝකාලීන භාවිතයට සුදුසු පරිදි ප්‍රමාණවත් නඩත්තුවකින් තොරව පැවැතුණි. | ඉදිරි කාලයේදි මෙවැනි අඩුපාඩු සිදුනොවී පැවැතීමට පියවර ගනු ලැබේ. | ප්‍රමාණවත් ලෙස නඩත්තු කටයුතු සිදු කළයුතුය. |
| (iii) | ඉහත උද්‍යානයට වැඩ අධීක්ෂකවරයෙකු සහ කම්කරුවන් 02ක් යොදවා තිබූ නමුත් තණකොල වැවී තිබූ අතර 2017 වර්ෂයේ එක්කළ එකතුව රු. 3,000,000කට අධික වටිනාකමින් වූ ක්‍රීඩා උපකරණ නඩත්තුවකින් තොරව සහ කැඩී ගොස් පැවැතුණි. | ජලය දැමීමටත්, නඩත්තු කිරීමටත් දෛනිකව සේවකයන් පත්කර ඇති අතර සන්ධ්‍යා කාලයේ ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමට එක් සේවකයෙකුත් එක් මුරකරුවෙකුත් රාජකාරියේ නිරතව සිටී. | නියමිත නඩත්තු කටයුතු සිදුකළ යුතුය. |
| (ඇ) | කාන්තා සහ ආබාධිත අය සඳහා වැසිකිලි ඉදිකිරීම | | |
| | ඉහත ව්‍යාපෘතිය කාන්තාවන් සහ ආබාධිත අය සඳහා ඉදිකර තිබුණත් එම පහසුකම් ලබාගැනීමට (හාන්සිවීම්, අත්වාරුව) යටිතල පහසුකම් ඇස්තමේන්තුවේ ඇතුළත් නොකිරීම නිසා රු. 437,000 ක් පිරිවැය වූ ඉහත කාර්යයෙහි පූර්ණ ප්‍රතිඵල මේ දක්වා ලබාගෙන නොතිබුණි. | අදාල දොර සඳහා enamel painting කාර්යය මේ වන විට සිදුකර අවසන් බව දන්වමි. | අදාල කටයුතු සිදුකළ යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ) සේවක පුරප්පාඩු සහ අතිරික්තයන්** | | |
| ප්‍රාථමික මට්ටමේ තනතුරු 14ක පුරප්පාඩුත්, ද්විතියික මට්ටමේ තනතුරු 08ක පුරප්පාඩුත් වශයෙන් පුරප්පාඩු 22ක් පිරවීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අනුමත කළ කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම සඳහා ඉල්ලීම් පසුගිය වර්ෂයේ පළාත්පාලන කොමසාරිස්වරයාට ලිපි යවා ඇත. | සුදුසු ක්රියාමාර්ග ගත යුතුය |
| **(ආ) සේවක ණය** | | |
| අනියම් සේවකයෙකුට ලබාදුන් රු.102,620ක ආපදා ණය වර්ෂ 11ක සිට අයනොකර හිඟහිටව පැවතුණි. | අදාල සේවකයා ණය ලබාගැනීමේදී වර්ෂ 10ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හේතුවෙන් ණය සඳහා ඇපකරුවකු ඉදිරිපත් කර නොතිබුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ සභාවේ අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර තිබුණත්, විගණන කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි. | සභාවේ අභ්‍යන්තර විගණක නිලධාරියාගේ රාජකාරියේ වගකීම අනුව දින 03ක් කට්ටයිපරිච්චාන් උපකාර්යාලයේ රාජකාරි ඉටුකරනු ලබන අතර ඉතිරි දින 02 ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදුකර තිබුණි. මේ හේතුවෙන් අභ්‍යන්තර විගණන කාර්යයන් සිදුකර නොතිබුණි. | ස්වාධීන අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත් කළයුතුය. |

### 4.2 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන අරමුණු පනත ප්‍රකාරව 2030 වර්ෂයේ ළඟාකර ගතයුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සභාව විසින් පිළියෙල කර නොතිබුණි. | රටෙහි පැවති කොවිඩ් - 19 සහ අයහපත් වාතාවරණය හේතුවෙන් ක්‍රියාමාර්ග ගත නොහැකිව පැවතුණි. තිරසාර සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කර තිබුණත් ඒ සඳහා වූ න්‍යාය පත්‍රය පිළියෙල කර නොතිබුණි. ඉදිරි කාලයේදි විධිමත්ව සිදුකරනු ලැබේ. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4.3 වෙනත් නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ තොග සමීක්ෂණ කටයුතු සිදුකළ කමිටුවේ වාර්තාව අනුව සභාවේ ඇති ජල බවුසර් 03ක්, යතුරු පැදියක්, කසල බැහැර කිරිමේ බවුසර් සහ කණ්ඩායම් භාවිතයට ඇති පිකප් වාහනයක් ආදිය ඉවත් කිරීමට නිර්දේශ කර තිබුණත්, වර්ෂ 05කට අධික කාලයක් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වාහනවල හිමිකාරිත්වය මාරුකිරීමෙන් පසුව අදාල කටයුතු සිදුකෙරේ. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය |